සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# දෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2017
# Second Term Test - Grade 9 - 2017

නම : ............................................ **ඉතිහාසය** කාලය : පැය 2යි.

**සැලකිය යුතුයි:**
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

## I කොටස

- **අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවලට වරහන් තුළ දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

(1) ලංකාවේ ලන්දේසින් සතු ප්‍රදේශ බ්‍රිතාන්‍යයන්ට ලියවිල්ලකින් භාරදීමට කටයුතු කළේ ඕලන්ද පාලක ............................ කුමරුය.

(2) ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටවූයේ ............................................ ප්‍රතිසංස්කරණ සමයේ ය.

(3) ඩොනමෝර් ප්‍රතිසංස්කරණ මගින් ශ්‍රී ලාංකික ජනතාවට ....................................................... ඡන්ද බලය ලැබුණි.

(4) ලංකාවේ කිතුදහම ප්‍රචාරය කිරීම සඳහා සංවිධානය වූ ව්‍යාපාරය ......................................................... ව්‍යාපාරය ලෙස හඳුන්වයි.

(5) ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍යවරයා වීමේ ගෞරවය හිමිවන්නේ ................................................................. මහතාට ය.

(මිෂනාරි, D.S. සේනානායක, සර්වජන, විලියම්, අමද්‍යප, කෝල්බෲක්, ෆෙඩ්රික් නෝර්ත්, S.W.R.D. බණ්ඩාරනායක)

- **අංක 06 සිට 10 දක්වා ප්‍රකාශ හරිනම් (3) ලකුණ ද වැරදි නම් ( 8 ) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.**

(6) ජූරිය මගින් නඩු විසඳීමේ ක්‍රමය ආරම්භ වූයේ තෝමස් මේට්ලන්ඩ් ආණ්ඩුකාරවරයාගේ සමයේ ය. (      )

(7) ශ්‍රී ලාංකික ජනතාවට සීමිත ඡන්ද බලය ලැබුණේ මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගිනි. (      )

(8) 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය යටතේ විධායක කාරක සභා හතක් ක්‍රියාත්මක විය. (      )

(9) ඓතිහාසික පානදුරාවාදය මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමිගේ පුරෝගාමිත්වයෙන් ඇතිවිය. (      )

(10) S.W.R.D. බණ්ඩාරනායක මහතා සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත් කිරීමට කටයුතු කළේ ය. (      )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා ඉරක් අඳින්න.**

(11) රාජකාරී ක්‍රමය අවලංගු කළේ කුමන ආණ්ඩුකාරවරයාගේ කාලයේද?
(i) ෆෙඩ්රික් නෝර්ත් (ii) රොබට් බ්‍රවුන්රිග්
(iii) එන් එංගල් බෙග් (iv) තෝමස් මේට්ලන්ඩ්

(12) ව්‍යවස්ථාදායකයට පළාත්බද ඡන්ද කොට්ඨාස ක්‍රමය මත නියෝජිතයන් තෝරාගත්තේ කුමන ප්‍රතිසංස්කරණයෙන්ද?
(i) කෝල්බෲක් (ii) මැනිං ඩෙවොන්ෂයර් (iii) කෲව් මැකලම් (iv) මැනිං ප්‍රතිසංස්කරණය

(13) 1931 හඳුන්වා දුන් ඩොනමෝර් ප්‍රතිසංස්කරණයේ විධායක කාරක සභාපති ලෙස C.W.W. කන්නන්ගර මහතා පත්වූයේ කුමන විධායක කාරක සභාවට ද?

(i) අධ්‍යාපන (ii) සෞඛ්‍යය (iii) කෘෂිකර්ම හා ඉඩම් (iv) පළාත් පාලනය

(14) රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙන පිහිට වීමට මුල් වූයේ කවුද?

(i) වලානේ සිද්ධාර්ථ හිමි. (ii) හික්කඩුවේ සුමංගල හිමි.
(iii) රත්මලානේ ධර්මාලෝක හිමි. (iv) වාරියපොල සුමංගල හිමි.

(15) මෙරට පිහිටුවන ලද ප්‍රථම දේශපාලන පක්ෂය වූයේ මින් කුමක්ද?

(i) ලංකා සම සමාජ පක්ෂය (ii) කම්කරු පක්ෂය
(iii) එක්සත් ජාතික පක්ෂය. (iv) ශ්‍රී ලංකා නිදහස් පක්ෂය

v **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට සුදුසු පිළිතුර හිස්තැනෙහි ලියන්න.**

(16) ඉංග්‍රීසින් ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ වලින් මුල්ම ප්‍රහාරය එල්ල කළේ ................................................ ය.

(17) 1833 සිට ව්‍යවස්ථාදායකය හා විධායකය අතර බෙදී පැවති නීති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම 1931 ප්‍රතිසංස්කරණයෙන් ......................................................... සභාවට පැවරුණි.

(18) ශ්‍රී ලංකාවේ අමද්‍යප ව්‍යාපාරයේ පියා ............................................................ නමින් හඳුන්වයි.

(19) ප්‍රථම බහුකාර්ය යෝජනා ක්‍රමය වන ............................................................. ව්‍යාපාරය D.S. සේනානායක මහතාගේ උත්සාහයේ ප්‍රතිඵලයකි.

(20) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලංකාවට හිමි වූයේ අගමැති ........................................... මහතාගේ පාලන සමයේදී ය. (ලකුණු 2 x 20 = 40 )

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) (අ) ඔබට සපයා ඇති ලංකා සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කොට නම් කරන්න.

(i) වලවේ ගඟ (ii) ගම්පොළ (iii) කොළඹ (iv) මාතර (v) ත්‍රිකුණාමලය

(ලකුණු 10)

(ආ)



(i) මෙම පින්තූරයෙන් දක්වෙන පුද්ගලයා නම් කරන්න.

(ii) ඔහුගේ මුල් නම කුමක්ද?

(iii) ඔහු විසින් ආරම්භ කළ පාසලක් නම් කරන්න. (ලකුණු 3)



(ඇ) (i) මෙම පින්තූරයේ දක්වෙන්නේ කුමක්ද?

(ii) මෙය පිහිටා ඇති ස්ථානය නම් කරන්න.

(iii) මෙහි සිදුකරන ලද කටයුතු වර්තමානයේ සිදුකරන ස්ථානය පිහිටියේ කුමන නගරයේ ද?

(ලකුණු 3)

(02) (i) 1797 බ්‍රිතාන්‍යයන්ගෙන් මුහුදුබඩ ප්‍රදේශ පාලනයට විරුද්ධව ඇති වූ කැරැල්ලට හේතු වූ කරුණු තුනක් නම් කරන්න. (ලකුණු 3)

(ii) පහත සඳහන් ප්‍රතිසංස්කරණ අතරින් ෆෙඩ්රික් නෝර්ත්ගේ ප්‍රතිසංස්කරණ තුනක් තෝරා ලියන්න.

A - ශ්‍රේෂ්ඨාධිකරණයක් පිහටුවීම.

B - දේශීය නිලධාරීන්ගේ බලතල අඩු කිරීම.

C - සිවිල් නඩු සම්බන්ධ අභියාචනාධිකරණයක් පිහිටුවීම.

D - ජූරිය මගින් නඩු විසඳීමේ ක්‍රමයක් ඇති කිරීම.

E - වසූරිය එන්නත ලබාදීමේ ක්‍රමයක් ඇති කිරීම. (ලකුණු 3)

(iii) බ්‍රිතාන්‍යයන්ට උඩරට අල්ලා ගැනීමට අවශ්‍ය වූයේ කුමන හේතු නිසා දැයි කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 5)

(03) (i) උඩරට අල්ලා ගැනීමට නෝර්ත් ආණ්ඩුකාරවරයා දැරූ උත්සාහය අසාර්ථක වීමට හේතු තුනක් ලියන්න. (ලකුණු 3)

(ii) පහත ප්‍රකාශවලට අදාළ පිළිතුරු ABC අනුපිළිවෙලින් ලියන්න.

A - බෝගම්බර වැව අලංකාර කිරීම.

B - ඉංග්‍රීසි කොඩිය බිම දමා සිංහල කොඩිය එස වූ හිමි නම.

C - 1818 නිදහස් අරගලය මර්දනයට ඉංග්‍රීසින් විසින් සිංහලයන් වෙත යවන ලද සිංහල රදළ නායකයා. (ලකුණු 3)

(iii) 1818 නිදහස් අරගලය මර්දනය කළ ආකාරය බ්‍රිතාන්‍යයන් අනුගමනය කළ උපක්‍රම දෙකක් ඇසුරින් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

(04) (i) කෝල්බෲක් කොමිසම ලංකාවට පැමිණි පසු ඔහු විමර්ශනයට ලක් කළ අංග තුනක් නම් කරන්න. (ලකුණු 3)

(ii) පහත ABC වලින් දක්වා ඇත්තේ මෙරට පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් දක්වා යන ගමනේදී වැදගත් වන යෝජනා කිහිපයකි. එම යෝජනා ඉදිරිපත් වූයේ කුමන ආණ්ඩු ක්‍රමයෙන් දැයි ලියා දක්වන්න.

A - උඩරට පහතරට ඒකාබද්ධ කොට රට එක්සත් කිරීම.

B - පළාත්බද ඡන්ද කොට්ඨාශ ක්‍රමය හඳුන්වා දීම.


C - සර්ව ජන ඡන්ද බලය ලැබීම. (ලකුණු 3)

(iii) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ දේශීය බලධාරීන්ට රාජ්‍ය පාලනයට සම්බන්ධ වීමේ බලය මෙන්ම වගකීමද ලැබුණි. විධායක කාරක සභා ක්‍රමය ඇසුරින් මෙය පැහැදිලි කරන්න.

(ලකුණු 5)

(05) (i) කිතු දහම පැතිරවීමේ අරමුණින් බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරට ක්‍රියාත්මක වූ මිෂනාරි සමාගම් තුනක් නම් කරන්න. (ලකුණු 3)

(ii) ලංකා සිතියමේ ABC අක්ෂර වලින් දක්වා ඇත්තේ එම මිෂනාරි සමාගම් වල මධ්‍යස්ථාන තුනකි. එම ස්ථාන තුන නම් කරන්න.




A -
B -
C - (ලකුණු 3)

(iii) කිතු දහම ව්‍යාප්ත කිරීමට මිෂනාරී සමාගම් අනුගමනය කළ ක්‍රියාමාර්ග කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

(06) (i) ලංකාවේ දේශපාලන බලතල ලබා ගැනීමේ අරමුණින් ක්‍රියාත්මක වූ සංගම් තුනක් නම් කරන්න. (ලකුණු 3)

(ii) පහත ABC වලින් සඳහන් වන්නේ දේශපාලන ක්ෂේත්‍රයේ කැපී පෙනෙන නායකයින් කීප දෙනෙක් හැඳින්වීමට යොදාගත් අන්වර්ථ නාමයන් ය. ඔවුන්ගේ සැබෑ නම ඒ ඉදිරියෙන් ලියා දක්වන්න.

A - කෝට්ටේ සිංහයා
B - ජාතියේ පියා
C - අමද්‍යප ව්‍යාපාරයේ පියා (ලකුණු 3)

(ii) ලංකා ජාතික සංගමය බිහිවීමට බලපෑ හේතු දෙකක් දක්වා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

(07) (i) 1947 සිට මෙරට අග්‍රාණ්ඩුකාරධූරය දැරූ තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 3)

(ii) 1948 - 1972 කාලය තුළ බිහිවූ දේශපාලන පක්ෂ තුන නිර්මාණය කිරීමට මුල් වූ නායකයින් තිදෙනෙක් ABC අනුපිළිවෙලින් දක්වේ. එම නායකයින් නිර්මාණය කළ පක්ෂ ඉදිරියෙන් ලියන්න.

A - වී.එච්.ජේ.වී. චෙල්වනායගම්
B - එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක
C - පිලිප් ගුණවර්ධන (ලකුණු 3)

(iii) බ්‍රිතාන්‍යයන් විසින් ශ්‍රී ලංකාවට නිදහස ලබා දීමට තීරණය කර 1947 දී ඩී.එස්.සේනානායක මහතා සමග ඇති කරගත් ගිවිසුම් දෙකක් දක්වා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

(08) (i) අනගාරික ධර්මපාලතුමා සුරාවට එරෙහිව කළ ශ්‍රේෂ්ඨ ප්‍රකාශ 2ක් නම් කරන්න. (ලකුණු 2)

(ii)

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 1 පා | | | 2 රා | ▨ | ▨ | 3 ආ | | |
| | ▨ | ▨ | 3 | | | | | |
| | ▨ | ▨ | | ▨ | ▨ | | | |
| ඩ | ▨ | ▨ | | ▨ | ▨ | 5 | | |
| | 4 බු | ▨ | | ▨ | ▨ | ▨ | | |
| ▨ | | ▨ | ▨ | ▨ | ▨ | ▨ | | |
| ▨ | 4 ධ | | 5 ම | | | | | |
| ▨ | | ▨ | | ▨ | ▨ | | | |
| ▨ | | ▨ | | ▨ | ▨ | | | |
| ▨ | | ▨ | ධි | ▨ | ▨ | | | |

(ලකුණු 9)

හරහට

1. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් මුල් වූ වාදය.
3. සිද්ධි ලෙබ්බේ මහතා සහිරා විද්‍යාලය ආරම්භ කළේ මේ ප්‍රදේශයේය.
4. බුද්ධගයාව බේරා ගැනීමට මෙතුමා පියවර ගත්තේය.
5. කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මගින් ලංකාව බෙදූ පළාත් වලින් එකකි.

පහළට

1. නාවලර්තුමා ප්‍රකාශයට පත් කළ පෙළපොතකි.
2. හින්දු පුනරුදය ව්‍යාපාරයට දායකත්වය දුන් නායකයෙකි.
3. ඕල්කට්තුමා මුල් වී ආරම්භ කළ බෞද්ධ ආගමික පාසලකි.
4. හින්දු මහත්මා කෙනකු යටතේ මෙය පැවතුණි
5. මහනුවර ප්‍රදේශයේ මේ නමින් විශ්‍රාම ශාලාවක් ඉදිකිරීමට ධර්මපාලතුමා දායකත්වය ලබා දී ඇත.

II වන කොටසේ පළමු ප්‍රශ්නය සඳහා



Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# දෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2017
# Second Term Test - Grade 9 - 2017

## ඉතිහාසය පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | |
|---|---|---|---|
| (1) - විලියම් | (6) ( 4 ) | (11) ෆෙඩ්රික් නෝර්ත් | (16) ත්‍රිකුණාමලයට |
| (2) - කෝල්බෲක් | (7) ( 8 ) | (12) මැනිං | (17) රාජ්‍ය මන්ත්‍රණ සභාවට |
| (3) - සර්වජන | (8) ( 4 ) | (13) අධ්‍යාපන | (18) ආතර් වී දියෙස් |
| (4) - මිෂනාරි | (9) ( 4 ) | (14) වලානේ සිද්ධාර්ථ හිමි | (19) ගල් ඔය ව්‍යාපාරය |
| (5) - ඩී.එස්.සේනානායක | (10) ( 4 ) | (15) කම්කරු පක්ෂය | (20) අගමැති ශ්‍රීමත් ජෝන් කොතලාවල මහතා |

(ලකුණු 2 x 20 = 40 )

### II කොටස

(01) (අ)



(ලකුණු 10)

(ආ) (i) අනගාරික ධර්මපාලතුමා
(ii) දොන් ඩේවිඩ් හේවාවිතාරණ
(iii) පන්නිපිටියේ ධර්මපාල
කොළඹ ආනන්ද බාලිකා විදුහල
(ලකුණු 3)

(ඇ) (i) පැරණි පාර්ලිමේන්තුව
(ii) ගාලුමුවදොර පිටිය
(iii) ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ (ලකුණු 3)

(02) (i) මුදලින් බදු ගෙවීම, නව බදු පැනවීම, බදු එකතු කිරීමේ අයිතිය වෙන්දේසියේ විකිණීම, බදු එකතු කිරීම සඳහා ''අවුමිල්දාර්'' යන නිලධාරීන් පත් කිරීම. (ලකුණු 3)

(ii) ශ්‍රේෂ්ඨාධිකරණයක් පිහිටුවීම, සිවිල් නඩු සම්බන්ධ අභියාචනාධිකරණයක් පිහිටුවීම, වසූරිය එන්නත ලබාදීමේ ක්‍රමයක් ඇති කිරීම. (ලකුණු 3)

(iii)
- වෙළඳ ද්‍රව්‍ය ලබා ගැනීමේදී උඩරට හා මුහුදු ප්‍රදේශ අතර කඩවත් වලදී බදු ගෙවීමට සිදුවීම නිසා වෙළඳාමට එල්ල වූ අවහිරතා මඟ හැරීම.
- පාලන මධ්‍යස්ථානය වූ කොළඹත්, නාවික මධ්‍යස්ථානය වූ ත්‍රිකුණාමලයත් අතර ගොඩබිම් සබඳතා සඳහා උඩරට රාජ්‍යයෙන් වූ අවහිරතා මග හැරීම.
- කොළඹ හා ත්‍රිකුණාමලය අතර මුහුදු සබඳතා විශාල මුදලක් හා කාලයක් ගතවීම. (ලකුණු 5)

(03) (i) උඩරට සිංහලයන්ගේ එකමුතු බව, ගරිල්ලා සටන් ක්‍රම, උඩරටියන්ගේ රාජ පාක්ෂික බව (ලකුණු 3)

(ii) A - ශ්‍රී වික්‍රම රාජසිංහ රජු
B - වාරියපොළ සුමංගල හිමි
C - මොණරවිල කැප්පෙටිපොල (ලකුණු 3)

(iii) මාර්ෂල් ලෝ හෙවත් යුධ නීතිය, බිම්පාළු ප්‍රතිපත්තිය විස්තර කිරීම (ලකුණු 5)

(04) (i) ශ්‍රී ලංකාවේ පරිපාලනය, ආදායම් හා වියදම්, රාජ්‍ය පරිපාලන ආයතන, අධිකරණ ක්ෂේත්‍රය (ලකුණු 3)

(ii) A - කෝල්බෲක් ආණ්ඩුක්‍රමය
B - මැනිං ආණ්ඩුක්‍රමය
C - ඩොනමෝර් ආණ්ඩුක්‍රමය (ලකුණු 3)

(iii) ශ්‍රී ලාංකික දේශපාලකයන්ට අනාගත වගකීම් සහිත ආණ්ඩුවක් ක්‍රියාත්මක කිරීමට පෙරහුරුවක් ලබා ගැනීම විධායක කාරක සභා ක්‍රමය මගින් සිදුවිය. කාරක සභා 7කට බෙදීම, එක් එක් කාරක සභා සඳහා ඇමතිවරු පත් කිරීම ආදී කරුණු. (ලකුණු 5)

(05) (i) ලන්ඩන් මිෂනාරි සමාගම, බැප්ටිස්ට් මිෂනාරි සමාගම, වෙස්ලියන් මිෂනාරි සමාගම, ඇමරිකානු මිෂනාරි සමාගම ආදී (ලකුණු 3)

(ii) A - කල්පිටිය
B - ගාල්ල
C - මහනුවර (ලකුණු 3)

(iii) රාජ්‍ය අනුග්‍රහය ලබා ගැනීම, මිෂනාරි සමාගම් තරගකාරී ලෙස කටයුතු කිරීම, සමාජ සේවා කටයුතු වල නියැලීම , පොත් පත්‍රිකා ප්‍රකාශයට පත් කිරීම. (ලකුණු 5)

(06) (i) හලාවත සංගමය, පහතරට වැවිලිකරුවන්ගේ සංගමය, ලංකා ප්‍රතිසංස්කරණ සංගමය, යාපනය සංගමය. (ලකුණු 3)

(ii) A - ඊ.ඩබ්. පෙරේරා මහතා
B - ඩී.එස්.සේනානායක මහතා
C - ආතර් වී. දියෙස් (ලකුණු 3)

(iii) 1915 සිංහල මුස්ලිම් කෝලාහල, අමද්‍යප ව්‍යාපාරයෙන් ලැබූ පන්නරය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 5)

(07) (i) ශ්‍රීමත් හෙන්රි මන්ක්, මේසන් මුවර්, සෝල්බරි සාමි, ශ්‍රීමත් ඔලිවර් ගුණතිලක, ශ්‍රීමත් විලියම් ගොපල්ලව (ලකුණු 3)

(ii) A - ෆෙඩරල් පක්ෂය
B - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
C - වාමාංශික පක්ෂය (ලකුණු 3)

(iii) ආරක්ෂක ගිවිසුම, රාජ්‍ය සේවකයන් සම්බන්ධ ගිවිසුම, බාහිර සබඳතා පිළිබඳ ගිවිසුම හැඳින්වීම. (ලකුණු 5)

(08) (i) රා බොන්නා උගුඩුවෙකි, රා බොන්නා වසලයෙකි. (ලකුණු 2)

(ii)

| හරහට | | පහළට | |
|---|---|---|---|
| 1. | පානදුරා | 1. | පාලපාඩම් |
| 3. | මරදාන | 2. | රාමනාදන් |
| 4. | ධර්මපාල | 3. | ආනන්ද |
| 5. | දකුණ | 4. | බුද්ධගයාව |
| | | 5. | මහාබෝධි |

(ලකුණු 9)